# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2039/32 - 2017 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා - 2017.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2001(1).

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**තිලක් මාරපන,**
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි සහ ඒවා යැවීමේ උපක්‍රම ව්‍යාප්ත වීම ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට තර්ජනයක් බව තහවුරු කරනු ලබන්නා වූ ද, (මෙහි මින්මතු "DPRK" යනුවෙන් සඳහන් කරනු ලබන) කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව විසින් ස්වකීය න්‍යෂ්ටික සහ බැලිස්ටික් මිසයිල වැඩසටහන ආශ්‍රිත සියලු ක්‍රියාකාරකම් අත්හිටුවිය යුතු බවට සහ ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාවට තර්ජනයක් සිදුවීම සංයුක්ත කරනු ලබන්නා වූ සියලු න්‍යෂ්ටික අවි සහ දැනට පවතින න්‍යෂ්ටික වැඩසටහන අත්හැර දැමිය යුතු බවට අවධාරණය කරනු ලබන්නා වූ ද, 1718 (2006) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ සභා යෝජනා සම්මුතිය මගින් සහ ඒ යෝජනා සම්මුතියට පසුව ගෙන එන ලද යෝජනා සම්මුති වන 1874(2009), 2087(2013), 2094(2013), 2270(2016), 2321(2016) සහ 2371(2017) දරන යෝජනා සම්මුති ද ඇතුළුව පසුව ගෙන එන ලද වෙනත් යම් යෝජනා සම්මුතියක් මගින් සිදු කරන ලද වෙනස් කිරීම් සහ සවිමත් කිරීමක් මගින්, "DPRK" සම්බන්ධයෙන් සම්බාධක ක්‍රියාමාර්ග අදාළ කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් මත බැඳීම් සමූහයක් පනවනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ ක්‍රියාකරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් 2006 ඔක්තෝබර් 14 දින 1718(2006) දරන යෝජනා සම්මුතිය ඒකමතිකව සම්මත කරන ලදී.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### I වන කොටස

### නිසි බලධරයා

3. මේ නියෝගවල කාර්ය සඳහා, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නිසි බලධරයකු සිටිය යුතු ය.

### II වන කොටස

### තහනම් කරන ලද ක්‍රියාකාරකම්

4. (1) ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී -

(අ) ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලද හෝ එසේ නොවන, මේ නියෝගවල I වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති යම් අයිතමයක් ද ඇතුළුව (මෙහි මින්මතු නම් කළ අයිතමය හෝ නම් කළ සුඛෝපභෝගී හෝ අයිතමය යනුවෙන් සඳහන් කරනු ලබන) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ කමිටුව විසින් නම්කළ යම් අයිතමයක් හෝ සුඛෝපභෝගී අයිතමයක් DPRKහි සිටින යම් තැනැත්තකු වෙත හෝ DPRK වෙනුවෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු වෙත සෘජුව හෝ වක්‍රව සැපයීම, විකිණීම හෝ පැවරීම නොකළ යුතු ය ; හෝ

(ආ) DPRKහි උත්පාදනය කරනු ලබන හෝ එසේ නොවන, මෙම නියෝගවල II වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති අයිතම ද ඇතුළුව යම් නම්කළ අයිතමයක් හෝ නම්කළ සුඛෝපභෝගී අයිතමයක් DPRKහි සිටින යම් තැනැත්තකුගෙන් හෝ DPRK වෙනුවෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකුගෙන් ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම හෝ පැවරීම නොකළ යුතු ය.

(2) නිසි බලධරයා විසින් -

(අ) 2094(2013) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සහ යෝජනා සම්මුතියේ III සහ IV වන ඇමුණුම්වල, 2270(2016) දරන යෝජනා සම්මුතියේ IV වන ඇමුණුමේ සහ 2321(2016) දරන යෝජනා සම්මුතියේ III සහ IV වන ඇමුණුම්වල නිශ්චිතව දක්වා ඇති නම්කළ අයිතමවල සහ නම්කළ සුඛෝපභෝගී අයිතමවල පළමු ලැයිස්තු ; සහ

(ආ) එකී ලැයිස්තුවලට පසුව කරනු ලබන යම් සංශෝධන ඇතොත් එකී සංශෝධන සිදු කිරීමෙන් ඉක්බිතව ම,

වහාම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නිසි බලධරයා විසින්, මූල්‍ය බුද්ධි ඒකකය හරහා, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ කමිටුව විසින් එම අයිතම නම් කරනු ලැබීමෙන් ඉක්බිතිව ම එම නම්කළ අයිතම සහ නම්කළ සුඛෝපභෝගී අයිතම පිළිබඳව මූල්‍ය ආයතන වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

5. 4 වන නියෝගයේ (1) වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කරගෙන යෑමේ කාර්ය සඳහා හෝ 2321(2016) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතියේ 26 වන ඡේදය මගින් නිශ්චිතව දක්වා ඇති කොන්දේසි යටතේ ගල් අඟුරු ප්‍රසම්පාදනය කිරීමේ හෝ DPRK වෙතින් හෝ DPRK ජාතිකයන් විසින් යකඩ, යපස්, තඹ, නිකල්, රිදී සහ සින්ක් හෝ ප්‍රතිමා ප්‍රසම්පාදනය කිරීමේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් යාත්‍රාවක් හෝ ගුවන් යානයක් භාවිත කිරීමට කටයුතු සැලැස්වීම හෝ අවසර ලබා දීම නොකළ යුතු ය.

6. (1) ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී, DPRK වෙත හෝ යම් නම්කළ තැනැත්තකු වෙත හෝ නම්කළ ආස්ථිත්‍යයක් වෙත හෝ නම්කළ තැනැත්තකු හෝ නම්කළ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ එහි විධානය යටතේ ක්‍රියාකරනු ලබන යම් පුද්ගලයකු හෝ ආස්ථිත්‍යයක් වෙත හෝ එවැනි යම් නම්කළ තැනැත්තකුගේ හෝ නම්කළ ආස්ථිත්‍යයක ප්‍රතිලාභය සඳහා හෝ ඒ වෙනුවෙන් -

(අ) යම් යාත්‍රාවක් හෝ ගුවන් යානයක් කුලියට දීම හෝ කල් බදු පදනම මත ලබාදීම ; හෝ

(ආ) කාර්ය මණ්ඩල සේවා සැපයීම ; හෝ

(ඇ) අලුත් හෙලිකොප්ටර් යානා හෝ යාත්‍රා විකිණීම ;

නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී -

(අ) DPRK හි යාත්‍රා ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම හෝ DPRK ධජය භාවිතා කිරීම සඳහා අවසර ලබා ගැනීම ;

(ආ) DPRK ධජය දරනු ලබන යම් යාත්‍රාවක අයිතිය දැරීම, කල්බදු දීම හෝ මෙහෙය වීම ;

(ඇ) නීති විරෝධී මාර්ග තුළින් ද ඇතුළුව DPRK විසින් අයිතිය දරනු ලබන, පාලනය කරනු ලබන, හෝ මෙහෙයවනු ලබන යම් යාත්‍රාවක් සඳහා යාත්‍රා වර්ගීකරණ, සහතික කිරීම් හෝ ඒ ආශ්‍රිත සේවා සැපයීම ; හෝ

(ඈ) නීති විරෝධි මාර්ග තුළින් ද ඇතුළුව, DPRK විසින් අයිතිය දරනු ලබන යාත්‍රා සඳහා රක්ෂණ හෝ ප්‍රතිරක්ෂණ සේවා සැපයීම,

නොකළ යුතු ය.

(3) DPRK විසින් අයිතිය දරනු ලබන, පාලනය කරනු ලබන හෝ මෙහෙයවනු ලබන යම් යාත්‍රාවක් ලියාපදිංචියෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, එවැනි ලියාපදිංචියෙන් ඉවත් කරන ලද යම් යාත්‍රාවක් වෙනත් ධජය දරන රාජ්‍යයක් විසින් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

7. ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී -

(අ) යම් නම් කරන ලද අයිතමයක් සැපයීමට, නිෂ්පාදනය කිරීමට, නිපදවීමට, සන්තකයේ තබා ගැනීමට, අත්කර ගැනීමට, නඩත්තු කිරීමට, තොග රැස්කිරීමට, ගබඩා කිරීමට, වැඩි දියුණු කිරීමට, ප්‍රවාහනයට, පැවරීමට හෝ භාවිතයට අදාළව කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන ජනරජයෙහි සිටිනා යම් තැනැත්තකු වෙත හෝ DPRK හි යම් පුරවැසියකු වෙත වත්කම්, මූල්‍ය සේවා, තාක්ෂණික පුහුණුව, උපදෙස්, සේවා හෝ සහාය ලබාදීම හෝ ලබා ගැනීම ; හෝ

(ආ) DPRK හි සිටින යම් තැනැත්තකුගෙන් යම් නම් කරන ලද අයිතමයක් සැපයීමට, නිෂ්පාදනය කිරීමට, නිපදවීමට, සන්තකයේ තබා ගැනීමට, අත්කර ගැනීමට, නඩත්තු කිරීමට, තොගරැස් කිරීමට, ගබඩා කිරීමට, වැඩිදියුණු කිරීමට, ප්‍රවාහනය කිරීමට, පැවරීමට හෝ භාවිත කිරීමට අදාළව තාක්ෂණික පුහුණුව, උපදෙස්, සේවා හෝ සහාය ලබා ගැනීම,

නොකළ යුතුය.

8. නම් කළ තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට හෝ එවැනි යම් නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ ඔවුන්ගේ විධානය පරිදි ක්‍රියාකරන වෙනත් යම් තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයක්ට හෝ සම්පූර්ණයෙන් ම හෝ හවුල් වශයෙන් අයිතිය දරනු ලබන, හෝ පාලනය කරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්, යම් තැනැත්තකු විසින් ගනුදෙනු කරනු නොලැබිය යුතු ය.

9. (අ) යම් නම්කළ තැනැත්තකුට හෝ වෙනුවෙන් ;

(ආ) යම් නම්කළ ආස්ථිත්වයකට හෝ වෙනුවෙන් ; හෝ

(ඇ) එවැනි යම් නම්කළ තැනැත්තකු වෙනුවෙන් හෝ නම්කළ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ ඔවුන්ගේ විධානය යටතේ ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සඳහා එවන් නම් කළ තැනැත්තකු හෝ නම්කළ ආස්ථිත්‍යයක ප්‍රතිලාභය සඳහා හෝ ඒ වෙනුවෙන්,

ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී ඍජුව හෝ වක්‍රව අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ලබාදීම නොකළ යුතු ය.

10. ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින්, යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙත, න්‍යෂ්ටික ආශ්‍රිත, බැලිස්ටික් මිසයිල ආශ්‍රිත, වෙනත් සමූලඝාතක අවි ආශ්‍රිත DPRK හි වැඩසටහන් හෝ ක්‍රියාකාරකම් සඳහා හෝ 1874(2009), 2087(2013), 2094(2013), 2270(2016) සහ 2321 (2016) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති මගින් තහනම් කරන ලද වෙනත් ක්‍රියාකරකම්

සඳහා හෝ එවැනි යෝජනා සම්මුති මගින් පනවනු ලැබූ යම් ක්‍රියාමාර්ග මගහැර යාම සඳහා දායක කර ගැනීමට භාවිත කරනු ලැබීම සඳහා සාධාරණ හැකියාවක් ඇති ;

(අ) යම් මූල්‍ය සේවා සැපයීම ; හෝ

(ආ) තොග මුදල් ද ඇතුළුව මූල්‍ය වත්කම් හෝ වෙනත් වත්කම් හෝ සම්පත් පැවරීම,

නොකළ යුතු ය.

11. ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී, DPRK සමඟ වෙළදාමේ යෙදී සිටින යම් තැනැත්තකු වෙත අපනයන ණයවර, ඇපකර හෝ රක්ෂණය ප්‍රදානය කිරීම ද ඇතුළුව DPRK සමඟ වෙළදාමේ යෙදීම සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික මූල්‍ය සහාය ලබාදීම නොකළ යුතු ය.

12. ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු ශ්‍රී ලංකාවෙන් පිටත දී, DPRK වෙත ඉන්ධන සේවා සැපයීම, යාත්‍රා නඩත්තු සේවා සැපයීම, කල් බදු පදනම මත ලබා දීම හෝ කුලියට ලබා දීම හෝ යාත්‍රාවල කාර්ය මණ්ඩල පහසුකම් ලබා දීම නොකළ යුතු ය.

13. ශ්‍රී ලාංකික පුරවැසියකු වන තැනැත්තකු හැර, නම්කළ තැනැත්තකු හෝ නම්කළ තැනැත්තකුගේ පවුලේ සාමාජිකයකු විසින් ශ්‍රී ලංකාවේ දේශ සීමාවට ඇතුළුවීම හෝ ඒ හරහා සංක්‍රමණය වීම සිදු නොකළ යුතු ය.

14. (1) DPRK මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකාව තුළ අලුත් ශාඛා, පාලිත සමාගම් හෝ නියෝජිත කාර්යාල විවෘත කරනු නොලැබිය යුතු ය.

(2) යම් මූල්‍ය ආයතනයක් විසින් DPRK දේශසීමාව ඇතුළත නියෝජිත කාර්යාල, පාලිත සමාගම් හෝ ගිණුම් ස්ථාපිත කිරීම හෝ පවත්වාගෙන යෑම සිදු නොකළ යුතු ය.

(3) යම් ශ්‍රී ලාංකීය මූල්‍ය ආයතනයක් විසින් DPRK හි යම් මූල්‍ය ආයතනයක් සමග අලුත් හවුල් ව්‍යාපාර ඇති කර ගැනීම හෝ අයිතියට අදාළ සම්බන්ධතාවය ඇතිකර ගැනීම හෝ DPRKහි යම් මූල්‍ය ආයතනයක් සමග අන්‍යෝන්‍ය ව්‍යාපාර සම්බන්ධතා ස්ථාපිත කිරීම හෝ පවත්වාගෙන යෑම සිදු නොකළ යුතු ය.

15. (1) නිසි බලධරයා විසින් පහත දැක්වෙන තැනැත්තන් නෙරපීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය; එනම් -

(අ) DPRK රාජ්‍ය තාන්ත්‍රික නිලධරයන් ;

(ආ) DPRK රජයේ නියෝජිතයන් ;

(ඇ) රජයේ හෝ නියෝජිත ධුර තත්ත්වයක සිටිමින් ක්‍රියාකරන අනෙකුත් DPRK ජාතිකයින් ;

(ඈ) නම්කළ තැනැත්තකු හෝ නම්කළ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ක්‍රියා කරන හෝ ඔවුන්ගේ විධානය පරිදි ක්‍රියා කරන විදේශීය ජාතිකයන් ;

(ඉ) සම්බාධක මග හැර යාම සඳහා හෝ යෝජනා සම්මුති උල්ලංඝනය කිරීම සඳහා සහාය වන යම් පුද්ගලයකු හෝ ආස්ථිත්‍යයක් ;

(ඊ) DPRK වෙත හෝ පුද්ගලයකු ජාතිකත්වය දරන රාජ්‍ය වෙත ආපසු සියරට යැවීමේ කාර්ය සඳහා DPRK බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් වෙනුවෙන් හෝ එවැනි DPRK බැංකුවක හෝ මූල්‍ය ආයතනයක විධානය පරිදි ක්‍රියා කරනු ලබන පුද්ගලයකු.

එසේ වුවද, එක්සත් ජාතීන්ගේ කටයුතු පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ මූලස්ථානය හෝ වෙනත් එක්සත් ජාතීන්ගේ පහසුකම් වෙත DPRK රජයේ යම් නියෝජිතයකු සංක්‍රමනය වීම සඳහා ඉහත කී නිර්ණායක මගින් බාධාවක් ඇති නොවිය යුතු ය.

(2) පහත සඳහන් අවස්ථාවල දී නිසි බලධරයා විසින් (1) වන ඡේදය යටතේ නිර්දේශ ලබා දීම සිදු නොකළ යුතු ය; එනම් -

(අ) අධිකරණ ක්‍රියාවලිය සපුරාලීම සඳහා යම් පුද්ගලයකුගේ පැමිණීම නියම කර ඇති අවස්ථාවක දී ;

(ආ) වෛද්‍ය, ආරක්ෂක හෝ වෙනත් මානුෂීය කාර්යයක් සඳහා අනන්‍ය වශයෙන්ම යම් පුද්ගලයකුගේ පැමිණීම අවශ්‍ය වී ඇති අවස්ථාවක දී ; හෝ

(ඇ) යම් පුද්ගලයකු නෙරපීම යෝජනා සම්මුතිවල අරමුණුවලට පටහැනි බවට කමිටුව විසින් එක් එක් අවස්ථාව මත පදනම්ව තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී.

16. නම් කරන ලද ආස්ථිත්‍යවල නියෝජිත කාර්යාල වසා දමන ලෙස සහ එවැනි ආස්ථිත්‍ය මෙන්ම ඔවුන් සඳහා හෝ ඔවුන් වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව ක්‍රියා කරනු ලබන පුද්ගලයන් හෝ ආස්ථිත්‍යයන්, හවුල් ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාරික වැඩපිළිවෙළවලට සහභාගී වීම තහනම් කරන ලෙස ශ්‍රී ලංකා රජය වෙත නිසි බලධරයා විසින් නිර්දේශ කරනු ලැබිය යුතු ය.

17. DPRK හි තහනම් කරන ලද වැඩසටහන් හෝ ක්‍රියාකාරකම් සඳහා හෝ සම්බාධක මගහැරයාම සඳහා දායකවීම හෝ ඒවා සඳහා ආදායම් උපදවීම වැළැක්වෙන පරිදි DPRK රාජ්‍ය තාන්ත්‍රික නිලධරයන් සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් උසස් මට්ටමේ සුපරික්ෂාකාරීත්වයක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

18. පහත නිශ්චිතව දැක්වෙන තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සඳහා මූල්‍ය ආයතනයක් විසින් එක් ගිණුමකට වඩා වැඩි ගණනක් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු බවට නිසි බලධරයා විසින් ශ්‍රී ලංකා රජය වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය. එනම් :–

(අ) DPRK රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙවරක් හෝ කන්සියුලර් ධූරයක් ;

(ආ) DPRK රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු හෝ කන්සියුලර් නිලධරයකු ;

(ඇ) (අ) හෝ (ආ) ඡේදවල සඳහන් තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට අයත් හෝ එවන් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් පාලනය කරනු ලබන යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් ;

(ඈ) (අ) හෝ (ආ) ඡේදවල සඳහන් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ එවැනි තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක විධානය පරිදි ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු.

## III වන කොටස

## අරමුදල් ක්‍රියා විරහිත කිරීම සහ තහනමට ගැනීම

19. (1) (මෙහි මින්මතු මෙම නියෝගවල "නම්කළ තැනැත්තා හෝ නම්කළ ආස්ථිත්‍යය" යනුවෙන් හඳුන්වනු ලබන) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව හෝ කමිටුව විසින් නම් කරන ලද තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් හෝ එවැනි නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සඳහා, එවැනි නම්කළ තැනැත්තකුගේ හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ එහි විධානය යටතේ ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් සෘජුව හෝ වක්‍රව අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන ශ්‍රී ලංකාවේ පවතින යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් නිසි බලධරයා විසින් වහාම ක්‍රියා විරහිත කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවල II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති තහනම් කරන ලද ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වන්නා වූ බවට රාජ්‍යය විසින් තීරණය කරනු ලබන උතුරු කොරියානු රජයේ සහ කොරියානු කම්කරු පක්ෂයේ ආස්ථිත්‍යයන්ගේ ශ්‍රී ලංකාවේ පවතින අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් නිසි බලධරයා විසින් වහාම ක්‍රියා විරහිත කරනු ලැබිය යුතු ය.

(3) නිසි බලධරයා විසින් -

(අ) 2087(2013) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතියේ I හා II වන ඇමුණුම්වල 2094 (2013) දරන යෝජනා සම්මුතියේ I හා II වන ඇමුණුම්වල, 2270 (2016) දරන යෝජනා සම්මුතියේ I හා II වන ඇමුණුම්වල සහ 2321(2016) දරන යෝජනා සම්මුතියේ I හා II වන ඇමුණුම්වල නිශ්චිතව දක්වා ඇති නම් කළ තැනැත්තන්ගේ සහ නම් කළ ආස්ථිත්‍යයන්ගේ පළමු ලැයිස්තු ; සහ

(ආ) එකී ලැයිස්තුවල පසුව කරනු ලබන සංශෝධන ඇතොත් එකී සංශෝධන සිදු කිරීමෙන් ඉක්බිතිව ම,

වහාම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) (2) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නිසි බලධරයා විසින්, මූල්‍ය බුද්ධි ඒකකය හරහා, මූල්‍ය ආයතන වෙත, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව හෝ කමිටුව විසින් එවැනි නම් කරනු ලැබීම් සිදු කිරීමෙන් ඉක්බිතිව ම එම නම් කළ අයිතම සහ නම් කළ සුබෝපභෝගී අයිතම පිළිබඳව දැනුම් දෙනු ලැබිය යුතු ය.

20. DPRK හි න්‍යෂ්ටික ආශ්‍රිත, බැලිස්ටික් මිසයිල ආශ්‍රිත හෝ වෙනත් සමූලඝාතක අවි ආශ්‍රිත වැඩසටහන් හෝ ක්‍රියාකාරකම්වලට දායකවීම සඳහා භාවිත කිරීමට සාධාරණ හැකියාවක් පවතින තොග මුදල් ද ඇතුළුව වෙනත් සම්පත් හෝ වෙනත් මූල්‍ය වත්කම් හෝ අරමුදල් නිසි බලධරයා විසින් වහාම ක්‍රියා විරහිත කරනු ලැබිය යුතු ය.

21. තහනම් කිරීමේ නියමයක බලපෑම විය යුත්තේ ආයෝජන කළමනාකරණය ඇතුළුව ගනුදෙනු කිරීමට අරමුදල් භාවිත කිරීම සඳහා හැකියාව ලැබෙන්නා වූ ප්‍රමාණය, මුදල, පිහිටීම, අයිතිය, සන්තකය, අධිකාරී බලය, ගමනාන්තය හෝ වෙනත් වෙනස්කමක් සිදුවීමට හේතු විය හැකි ඕනෑම ආකාරයක අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සංචලනය වීම, පැවරීම, වෙනස් කිරීම, භාවිතය හෝ ගනුදෙනු කිරීම තහනම් කිරීම විය යුතු ය.

එසේ වුව ද, බැරකරන ලද අරමුදල් ද, තහනම් කරන ලද අරමුදල් වන තාක්දුරට, තුන්වන පාර්ශවයක් විසින් ගිණුම වෙත පවරන ලද යම් තහනම් කිරීමේ ගිණුම් අරමුදලක් බවට එම ගිණුම පත්වීමට පෙරාතුව අවසන් කරන ලද හෝ උපචිත වූ එම ගිණුම මත අයවිය යුතු පොලිය හෝ වෙනත් ඉපයීම් හෝ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ බැඳීම් යටතේ අයවිය යුතු ගෙවීම් සමගින් එවැනි තහනම් කිරීමේ ගිණුමක් බැර කිරීම සඳහා එවැනි තහනම් කිරීමක් අදාළ නොවිය යුතු ය.

22. (1) (අ) අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ආරක්ෂා කිරීම් සඳහා තහනමට ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී ; හෝ

(ආ) එම අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් නාස්ති වී යා හැකි බවට සාධාරණ අවදානමක් පවතින අවස්ථාවක දී,

නිසි බලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමෙන් අනතුරුව මහාධිකරණය විසින්, ක්‍රියා විරහිත කරන ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් පිළිබඳ සෝදිසි කොට තහනමට ගන්නා ලෙස නිසි බලධරයා වෙත බලය පවරමින් නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) නිසි බලධරයා විසින් නිසි බලධරයාගේ ම මෙහෙයවීමෙන් හෝ ක්‍රියා විරහිත කරන ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් දරන්නාගේ ඉල්ලීම පරිදි (1) වන ඡේදය යටතේ මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය

(3) (2) වන ඡේදය යටතේ ප්‍රදානය කරන ලද යම් නියෝගයක් යටතේ යම් සෝදිසි කිරීමක් සිදුකරන අතරතුර දී ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දී එම නියෝගයට යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ඇතුළත් කරනු ලැබිය යුතු ව පැවැති බවට නිසි බලධරයා විසින් විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, නිසි බලධරයා විසින් එවැනි අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් තහනමට ගනු ලැබිය හැකි අතර එම තහනමට ගැනීමේ නියෝගය එවැනි තහනමට ගැනීමක් සඳහා බලය පැවරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ ප්‍රදානය කරන ලද යම් නියෝගයක් යටතේ තහනමට ගන්නා ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත්, මේ නියෝග යටතේ තහනමට ගන්නා ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් වශයෙන් පවතින තාක්කල් පමණක් රඳවාගනු ලැබිය හැකි ය.

23. ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසියකු වන තැනැත්තකු එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ කමිටුව විසින් නම් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම නම් කරනු ලැබීමෙන් පසුව හැකිතාක් ඉක්මණින් එම නම් කළ තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙත,නිසි බලධරයා විසින් -

(i) නම් කිරීම හා එහි බලපෑම් පිළිබඳව තොරතුරු ;

(ii) සමාලෝචනය කිරීමේ පටිපාටිය සහ ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ;

(iii) නම් කිරීම සඳහා බලපෑ හේතු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ හෙළි කළ හැකි තොරතුරු,

දැනුම්දීම සඳහා හැකි සියලු සාධාරණ උත්සහයක්ම දරනු ලැබිය යුතු ය.

24. 23 වන නියෝගයේ සඳහන් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් කමිටුව මගින් නම් කරනු ලැබීමේ දී, නම් කිරීමේ ලැයිස්තුවෙන් නම ඉවත් කරවා ගැනීමක් අපේක්ෂාවෙන් ඒ සඳහා සහාය ලබාදෙන ලෙස නිසි බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. නිසි බලධරයා විසින් ඒ ඉල්ලීම කමිටුව වෙත ඉදිරිපත් කොට, 1718(2006) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය සහ ඉහත කී පසුව ගෙන එන ලද සම්මුතිවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් සහ කාර්ය පටිපාටිවලට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

25. (1) නිසි බලධරයා විසින් එසේ කිරීම සඳහා වූ ස්වකීය චේතනාව පිළිබඳව කමිටුව වෙත දැනුම් දීමෙන් පසුව සහ කමිටුවේ නියමයන්ට අනුකූලවන පරිදි ක්‍රියාකිරීමෙන් පසුව නිශ්චිත අරමුදල් නිදහස් කර ගත හැකි වන පරිදි හෝ වත්කම් ලැබ ගත හැකි වන පරිදි 8, 9, හෝ 10 වන නියෝගවල සඳහන් තහනම් කිරීමක් ඉවත් කිරීම සඳහා විශේෂිත බලය ලබා දීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර බලය ලබා දීම සම්බන්ධයෙන් උචිත වන කොන්දේසි නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) කමිටුවේ නියමයන්ට අනුකූලව එවැනි අවස්ථාවක දී ඒ බලය ලබාදීම අවලංගු කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය. 1718(2006) සහ 2270((2016) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිවල සඳහන් ප්‍රමිති සහ කාර්ය පටිපාටිවලට අනුකූලව සහ 1718(2006) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති සහ ඉහත කී පසුව ගෙන එන ලද යෝජනා සම්මුතිවලට අනුව ක්‍රියා විරහිත කරන ලද අරමුදල් වෙත ප්‍රවේශවීමට අදාළ වෙනත් යම් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් සහ කාර්ය පටිපාටිවලට අනුකූලව නිසි බලධරයා විසින් ක්‍රියාකරනු ලැබිය යුතු ය.

26. (1) තමා නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් නොවන බවට කියා සිටින යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එකී තැනැත්තාගේ ආස්ථිත්‍යය කමිටුවේ ලැයිස්තුවේ සඳහන්වන තැනැත්තා හෝ ආස්ථිත්‍යය නොවන බවට ප්‍රකාශ කරමින් සහතිකයක් නිකුත් කරන ලෙස නිසි බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. ඒ සම්බන්ධයෙන් උචිත විමසීමක් සිදු කිරීමෙන් පසුව සහ ඉල්ලුම්කරු නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසුව නිසි බලධරයා විසින් ඉල්ලුම්කරු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ සහතිකයන් නිකුත් කිරීම නිසි බලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ද සහිතව ඔහු විසින් ස්වකීය තීරණය ඉල්ලුම්කරු වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

27. 26 වන නියෝගය යටතේ වූ නිසි බලධරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින්, එම තීරණය සමාලෝචනය කිරීම සඳහා, එකී තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙත එම තීරණය සන්නිවේදනය කරනු ලැබූ දින සිට දින තිහක කාලයක් ඇතුළත එම තීරණයට එරෙහිව මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

28. (1) යම් නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් 8, 9, 10, 11 සහ 12 වන නියෝග යටතේ වූ යම් බැඳීමකට අතිරේකව, යම් තැනැත්තකු විසින් -

(අ) තමා ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන යම් වර්තමාන ගනුදෙනුකරු, හෝ ගනුදෙනුකරු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් හෝ තමා විසින් දැනසිටින වෙනත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යක් බවට හෝ නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ක්‍රියාකරනු ලබන තැනැත්තකු බවට තමා විසින් දැන සිටී නම් හෝ සිදුකරයි නම්, ඒ පිළිබඳව අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම්දිය යුතු ය.

(ආ) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, එනම් -

(i) අරමුදල්වල තත්ත්වය, 20 සහ 21 වන නියෝග යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ග පිළිබඳව ;

(ii) නම්කළ තැනැත්තා වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරනු ලබන අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ නම්කළ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු ;

(iii) නම්කළ තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් සිදුකරන ලද යම් ගනුදෙනුවක් හෝ සිදු කිරීමට තැත් කරන ලද යම් ගනුදෙනුවක් පිළිබඳව ;

(iv) ක්‍රියාවිරහිත කරන ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් සම්බන්ධයෙන් සිදු කරන ලද යම් ගනුදෙනුවක් හෝ සිදු කිරීමට තැත් කරන ලද යම් ගනුදෙනුවක් පිළිබඳව ; සහ

(v) මේ නියෝගවලට අනුකූලව ක්‍රියාකිරීමට පහසුකම් සලස්වනු ලබන වෙනත් යම් තොරතුරු පිළිබඳව.

අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(ඇ) මේ තොරතුරු සත්‍යාපනය කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගීව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවලට අනුකූලව සපයන ලද හෝ ලැබුනු යම් තොරතුරක් එම තොරතුරු සපයනු ලැබූ හෝ ලැබී ඇති කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය. මේ නියෝගවලට අනුකූලව නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයා ඇති යම් තොරතුරක් යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවා ඇති යම් සීමාකිරීමක් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

29. (1) මේ නියෝග යටතේ වූ යම් බැඳීමකට අනුව 8, 9 හෝ 10 වන නියෝගය යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගයකට යටත් වන්නා වූ තොග මුදල් ද ඇතුළුව යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම්, ආර්ථික සම්පත්, වෙනත් සම්පත් හෝ වෙනත් මූල්‍ය වත්කම් හෝ අරමුදල් දරනු ලබන යම් තැනැත්තකු විසින්, ක්‍රියා විරහිත කිරීම ක්‍රියාත්මක වීමෙන් පසුව, ස්වකීය අරමුදල් වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කරනු ලැබ ඇති තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙත ඒ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳව සහ ක්‍රියා විරහිත කිරීම ඉවත් කර ගැනීම සඳහා පවතින කාර්යය පටිපාටිය පිළිබඳව දැනුම් දීමට සියලු සාධාරණ ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

(2) ඒ අරමුදල් දරනු ලබන තැනැත්තා විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ද වහාම දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය. මූල්‍ය බුද්ධි ඒකකය විසින් වහාම එම කාරණාව පිළිබඳව නිසි බලධරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) ක්‍රියා විරහිත කිරීමේ දින සිට සති දෙකක කාලයක් ඇතුළත ඒ ක්‍රියා විරහිත කිරීමෙන් බලපෑමට ලක් වූ තැනැත්තාගේ හෝ ආස්ථිත්‍යයේ නෛතික ස්ථිර පදිංචි ස්ථානය වෙත (1) වන ඡේදය යටතේ වූ දැනුම් දීම කරනු ලැබිය යුතු ය.

(4) ක්‍රියා විරහිත කිරීමෙන් බලපෑමට ලක් වූ තැනැත්තා හෝ ආස්ථිත්‍යය ශ්‍රී ලංකාවෙන් පිටත නිත්‍ය පදිංචිය දරන අවස්ථාවක දී, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳ දැන්වීම නිසි බලධරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මගින්, එම දැන්වීම භාරදෙන ලෙසට වන ඉල්ලීමක් ද සමග ඒ ක්‍රියා විරහිත කිරීමෙන් බලපෑමට ලක් වූ තැනැත්තා නිත්‍ය පදිංචිය දරන රටෙහි ආණ්ඩුව වෙත සපයනු ලැබිය යුතු ය.

30. මේ නියෝග යටතේ වූ බැඳීමකට අනුව 8, 9 හෝ 10 වන නියෝග යටතේ සිදුකරන ලද ක්‍රියාවිරහිත කිරීමේ ක්‍රියාමාර්ගයකට යටත් වන්නා වූ තොග මුදල් ද ඇතුළුව යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම්, ආර්ථික සම්පත්, වෙනත් සම්පත් හෝ මූල්‍ය සම්පත් හෝ අරමුදල් දරනු ලබන යම් තැනැත්තකු විසින්, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගයට පෙරාතුව කවර හෝ විටෙක දී, ස්වකීය අරමුදල් වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කිරීමට නියමිත බවට හෝ ඒ වත්කම් ලබා නොදෙන බවට ඒ නම් කළ තැනැත්තා වෙත දැනුම්දීම තහනම් විය යුතු ය.

31. මේ නියෝගවල සඳහන් විධිවිධානවලට අනුකූලව, DPRK හි න්‍යෂ්ටික ආශ්‍රිත, බැලිස්ටික් මිසයිල ආශ්‍රිත හෝ වෙනත් සමූලඝාතක අවි ආශ්‍රිත වැඩසටහන් හෝ ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයීම් වැළැක්වීමේ අරමුණින් යුතු ව නිසි බලධරයා විසින් උචිත බවට සලකනු ලබන යම් කොන්දේසි යටතේ නිසි බලධරයා විසින් -

(අ) යම් ආහාර, ඖෂධ, පවුල් වාසස්ථාන සඳහා කුලිය හෝ උකස්කර සහ එවැනි පවුලක සාමාජිකයන්ගේ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ගාස්තු සහ ගෙවීම් සඳහා වූ නිශ්චිත ගෙවීම් ඇතුළුව 19 වන නියෝගයේ (2) සහ (3) වන ඡේදවල ඇතුළත් කර ඇති යම් ස්වභාවික තැනැත්තකුගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකුගේ අත්‍යාවශ්‍ය මානුෂීය අවශ්‍යතා සඳහා ක්‍රියා විරහිත කරන ලද අරමුදල් භාවිත කිරීම හෝ වෙනත් එවැනි වත්කම් සැපයීම සඳහා ද ;

(ආ) පහත සඳහන් කාර්ය සඳහා ක්‍රියා විරහිත කරන ගිණුම්වලින් ගෙවීම් කිරීම හෝ වෙනත් වත්කම් සැපයීම කරනු ලැබීම සඳහා ද ; එනම් :-

(i) බදු, අනිවාර්ය රක්ෂණ වාරික සහ ගෑස්, ජලය, විදුලිබලය හා විදුලි සංදේශණය වැනි මහජන උපයෝගීතා සේවා සඳහා වූ, ගාස්තු ගෙවීම සඳහා ;

(ii) ගිණුම් පවත්වාගෙන යෑම සඳහා මූල්‍ය ආයතනවලට අයවිය යුතු ගාස්තු ගෙවීම සඳහා ;

(iii) නෛතික සේවා සැපයීම සම්බන්ධයෙන් වන වියදම් හෝ ක්‍රියාවිරහිත කරන ලද අරමුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් සාමාන්‍ය පරිදි දැරීම හෝ පවත්වාගෙන යෑම සඳහා වූ ගාස්තු හෝ සේවා ගාස්තු ගෙවීම සඳහා ද,

අවසර ලබා දිය හැකි ය.

32. (1) මුහුදු වරායවල් සහ ගුවන්තොටුපලවල් ඇතුළුව ශ්‍රී ලංකා දේශසීමාව තුළ පවතින DPRK වෙත යන හෝ එහි සිට පැමිණෙන යාත්‍රාවක හෝ ගුවන් යානයක ඇති බඩුතොගවල 4 වන හෝ 5 වන නියෝගය උල්ලංඝනය කරමින් යම් නම්කළ අයිතමයක් හෝ නම්කළ සුබෝපභෝගී අයිතමයක් අන්තර්ගත වන බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු සපයන තොරතුරු පවතින අවස්ථාවක දී, එවැනි යම් යාත්‍රාවක් හෝ ගුවන්යානයක් පරීක්ෂා කිරීම සඳහා නිසි බලධරයා විසින් එම තොරතුරු අදාළ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන වගන්තිය යටතේ වූ පරීක්ෂා කිරීමක් යම් යාත්‍රාවක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, අධීක්ෂණය කිරීමේ කාර්ය සඳහා ඇතුල්වීම අවශ්‍ය වන අවස්ථාවක දී, හදිසි අවස්ථාවක දී හෝ මුල් වරාය පිහිටි රටට ආපසු පැමිණීමක දී හැර, එවැනි යම් යාත්‍රාවක් ශ්‍රී ලංකාවේ යම් වරායකට ඇතුල්වීම සඳහා අවසර ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) DPRKහි මූලිකව උත්පාදනය වී ඇති හෝ DPRK වෙත යැවීමට නියමිතව ඇති හෝ DPRK විසින් හෝ DPRK ජාතිකයන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියාකරන හෝ ඔවුන්ගේ විධානය පරිදි ක්‍රියාකරනු ලබන යම් පුද්ගලයන් විසින් හෝ ආස්ථිත්‍ය විසින් හෝ ඔවුන් විසින් හෝ නම්කළ තැනැත්තන් හෝ ආස්ථිත්‍ය විසින් අයිතිය දරන හෝ පාලනය කරන ආස්ථිත්‍ය විසින් තැරැව් සේවා කරනු ලැබ ඇති හෝ පහසුකම් සලස්වා ඇති හෝ DPRK ධජය දරන ගුවන් යානයක් මගින් ප්‍රවාහන කටයුතු කරනු ලබන, යම් ගුවන්තොටුපලවල් ඇතුළුව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව හරහා සංක්‍රමණය වන සියලු භාණ්ඩ තොග පරීක්ෂා කිරීම සඳහා නිසි බලධරයා විසින් අදාළ නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(4) මානුෂීය අරමුණු සඳහා වන අවස්ථාවල දී, භාණ්ඩ තොග පැවරීමේ බලපෑම අවම වන පරිදි, කිසිදු නම්කළ අයිතමයක් හෝ නම්කළ සුබෝපභෝගී අයිතමයක් එසේ පවරනු නොලබන බවට සහතික වීම පිණිස, නිසි බලධරයා විසින් සියලු DPRK ධජය දරනු ලබන ගුවන්යානා ශ්‍රී ලංකාවට ගොඩබාන හෝ ශ්‍රී ලංකාවෙන් ගුවන්ගත වන අවස්ථාවේ දී පරීක්ෂා කිරීම සඳහා නිසිබලධරයා විසින් අදාළ නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

33. 32 වන නියෝගයේ සඳහන් එවැනි භාණ්ඩ තොග, ගුවන්යානා සහ යාත්‍රා පරීක්ෂා කිරීම එවැනි නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක කාර්යය වන්නේ ය.

34. (1) 4, 5, 6, 7, 8, 9, 10, 11 සහ 12 වන නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු, මේ නියෝග යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීමේ සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ නියෝගවල 28 වන සහ 29 වන නියෝගයන් හි දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු, මේ නියෝග යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

35. (1) ආරක්ෂක විෂය පවරා ඇති අමාත්‍යවරයා විමසා නිසිබලධරයාගේ නිර්දේශය සහිතව අමාත්‍යවරයා විසින් කලින් කල -

(අ) යම් නම්කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සමඟ සම්බන්ධතා පවතින බවට විශ්වාස කිරීම සඳහා නිසිබලධරයාට සාධාරණ හේතු පවතින යම් ස්වාභාවික තැනැත්තකු ;

(ආ) යම් නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සමඟ සම්බන්ධතා පවතින බවට විශ්වාස කිරීම සඳහා නිසිබලධරයාට සාධාරණ හේතු පවතින යම් නෛතික තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් ;

(ඇ) ඉහත (අ) හෝ (ආ) උපඡේදවල සඳහන් ස්වාභාවික හෝ නෛතික තැනැත්තන් හෝ ආස්ථිත්‍ය එකක් හෝ වැඩි ගණනක් විසින් ඍජුව හෝ වක්‍රව අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් නෛතික තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් ;

(ඇ) ඉහත (අ) හෝ (ආ) උපඡේදවල සඳහන් ස්වාභාවික හෝ නෛතික තැනැත්තන් හෝ ආස්ථිත්‍ය එකක් හෝ වැඩිගණනක් වෙනුවෙන් ක්‍රියාකරන හෝ ඔවුන්ගේ විධානය පරිදි ක්‍රියාකරන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක්; සහ

(ඉ) තහනම් කරන ලද ක්‍රියා සමග සම්බන්ධ බවට නිසිබලධරයා විසින් තීරණය කරනු ලබන DPRK රජයේ සහ කොරියානු වැඩකරුවන්ගේ පක්ෂයේ යම් ආස්ථිත්‍යයක්,

නම් කිරීම පිළිබඳව කමිටුවට යෝජනා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නම් කිරීමක් සඳහා වූ යෝජනාවක්, අදාළ එම තැනැත්තන්ට යන ආස්ථිතයට එරෙහිව යම් අපරාධ විමර්ශනයක් හෝ නඩු කටයුතු විභාග වෙමින් පැවතීම නොසලකා හරිමින්, අදාළ තැනැත්තන් හෝ ආස්ථිතය සම්බන්ධයෙන් අදාළ මූලාශ්‍රයෙන් ලබාගත් නිරවද්‍ය තොරතුරු හෝ කරුණු මත පදනම් විය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ නම් කිරීමට යෝජනා කරන්නා වූ ස්වාභාවික තැනැත්තන්ගේ හෝ නෛතික තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යවල නම්, එම ස්වාභාවික හෝ නෛතික තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍ය ඵලදායී සහ නිවැරදි ලෙස හඳුනාගැනීම සඳහා ඉඩ සලසන පරිදි විස්තර සහිත වන බවට සහතික වීම සඳහා නිසි බලධරයා විසින් අවශ්‍ය සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් කරන ලද යෝජනාවකට අනුව කමිටුව විසින් නම්කරන ලද තැනැත්තන්ගේ සහ ආස්ථිත්‍යවල ලැයිස්තුවේ පළ කරන ලද නම්, නිසි බලධරයා විසින්, එම නම්කළ තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යවල ලැයිස්තුවලින්, එම නම් තවදුරටත් තබා ගැනීම හෝ ඉවත් කිරීම සඳහා හෝ එවැනි නම්වලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා හේතු පවතින බවට සහතික වීම සඳහා සෑම වසරකටම යටත් පිරිසෙයින් එක් වරක් හෝ ක්‍රමානුකූල කාල පරතර තුළ දී සමාලෝචනය කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) (4) වන ඡේදය යටතේ නම් සමාලෝචනය කරනු ලැබීමේ දී, පසුව නම්කළ තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යවල ලැයිස්තුවල සඳහන් යම් නමක් තබා ගැනීම තවදුරටත් අවශ්‍ය නොවන බවට අනාවරණය වන අවස්ථාවක දී, එකී නම් එම ලැයිස්තුවලින් ඉවත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කමිටුව වෙත යෝජනා කරනු ලැබිය යුතු ය.

(6) නම්කළ තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යවල ලැයිස්තුවල ඇතුළත් කර ඇති නම්කළ තැනැත්තකුට අදාළ යම් තොරතුරක් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍යතාවක් පවතින අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් එම තොරතුර කමිටුව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් -

(අ) (1) වන ඡේදය යටතේ යම් නමක් නම් කරනු ලැබීම සඳහා යෝජනා කරනු ලබන අවස්ථාවක දී ;

(ආ) (5) වන ඡේදය යටතේ වූ නම්කළ තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යවල ලැයිස්තුවලින් යම් නමක් ඉවත් කිරීම සඳහා යෝජනා කරනු ලබන අවස්ථාවක දී ;හෝ

(ඇ) (6) වන ඡේදය යටතේ යම් තොරතුරක් යාවත්කාලීන කිරීමේ අරමුණකින් එවැනි තොරතුරක් සන්නිවේදනය කරනු ලබන අවස්ථාවක දී,

එම කාර්යය සඳහා කමිටුව විසින් අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටිය සහ සම්මත ආකෘති අමාත්‍යවරයා විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය.

(8) නම් කරනු ලැබීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට පෙරාතුව කිසිඳු අවස්ථාවක දී, කිසිදු තැනැත්තකු විසින්, එම තැනැත්තා හෝ ආස්ථිත්‍යය යෝජනා කරනු ලැබ ඇති බවට හෝ එම යෝජනාව සලකා බලමින් පවතින බවට එම තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙත දැන්වීම් සැපයීම නොකළ යුතු ය.

36. (1) මේ නියෝග යටතේ වූ යම් බැඳීමක් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය විය හැකි බවට අදාළ වන යම් කාරණයක් හෝ තොරතුරක් නිසිබලධරයා, මූල්‍ය බුද්ධි ඒකකය සහ අමාත්‍යවරයා විසින්, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ආයතන සම්බන්ධයෙන් වන විට දී, පරිපාලනමය දණ්ඩන පැනවිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා ඒ ආයතනවලට අදාළ අධීක්ෂණ අධිකාරීන් වෙත යොමු කළ යුතු ය.

(2) නිසිබලධරයා විසින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, මූල්‍ය බුද්ධි ඒකකය, අධීක්ෂණ අධිකාරීන් සහ වෙනත් උචිත නියෝජ්‍යායතනවල අදහස් විමසා මේ නියෝගවලට අනුකූලව ක්‍රියාකිරීම අධීක්ෂණය කිරීම සහ මේ නියෝගවලට අදාළ දණ්ඩන බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සැලැස්මක් නිර්මාණය කරනු ලැබිය හැකි ය.

(3) නිසිබලධරයා විසින්, මේ නියෝග යටතේ වූ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම සඳහා සහ බැඳීම් බලාත්මක කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) නිසිබලධරයා විසින්, මේ නියෝගවල සඳහන් විධිවිධාන බලාත්මක කිරීමේ දී, යම් තැනැත්තෙක් හෝ රාජ්‍ය ආයතනයක් විමසීම හෝ යම් තැනැත්තකුගෙන් හෝ රාජ්‍ය ආයතනයකින් තොරතුරු ඉල්ලා සිටීම සිදු කරනු ලැබිය හැකි ය.

37. මේ නියෝගවල කාර්ය සඳහා -

"ආයුධ සහ සම්බන්ධිත ද්‍රව්‍ය" යන්නෙන් ;

1991 දෙසැම්බර් 6 දිනැති A/RES/46/36L දරන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනා සම්මුතිය යටතේ ස්ථාපිත කර ඇත්තා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතිගත ආයුධ පිළිබඳ රෙජිස්ටරය වෙත සාමාජික රාජ්‍ය විසින් වාර්තා ලබාදීමේ කාර්යය සඳහා පවතින අර්ථයන් ම තිබිය යුතු වන්නා වූ -

(අ) ආයුධ ;

(ආ) උණ්ඩ ;

(ඇ) පහත දැක්වෙන දේ ද ඇතුළුව හමුදා වාහන සහ උපාංග එනම් :

(i) යුද්ධ ටැංකි ;

(ii) සන්නද්ධ ප්‍රහාරක රථ ;

(iii) විශාල උණ්ඩ විෂ්කම්භයක් සහිත කාලතුවක්කු පද්ධති ;

(iv) ප්‍රහාරක ගුවන් යානා ;

(v) ප්‍රහාරක හෙලිකොප්ටර් ;

(vi) යුද්ධ නැව් ; සහ

(vii) මිසයිල සහ මිසයිල පද්ධති ;

(ඈ) (අ) ඡේදයේ සිට (ඇ) ඡේදය දක්වා සඳහන් කර ඇති අයිතම සඳහා වූ අමතර කොටස් සහ උපාංග ;

(ඉ) පහත සඳහන් දේ ද ඇතුළු යුධහමුදාමය උපකරණ හා සමාන උපාංග එනම් :-

(i) බැටන්, මුගුරු, කැරලි දඬු, කඳුලු ගෑස් සහ ඒ හා සමාන උපාංග සහ නීතිය බලාත්මක කිරීමේ කාර්ය සඳහා භාවිත කරනු ලබන යම් ආකාරයක කැරලි පාලන කාරකයක් ; සහ

(ii) සිරුරු සන්නාහක, උණ්ඩ ප්‍රතිරෝධී ඇඳුම් සහ ආරක්ෂක හිස්වැසුම් ;

(iii) මාංචු, පාවිලංගු සහ සිරකරුවන් පාලනය කිරීම සඳහා භාවිත කරනු ලබන වෙනත් උපාංග ;

(iv) කැරලි ආරක්ෂක පලිහ ;

(v) කස ; සහ

(vi) ඉහත (i) සිට (vi) දක්වා වූ උපඡේදවල සඳහන් පරිදි භාවිත කිරීම සඳහා හෝ ඒ සමඟ භාවිත කිරීම සඳහා සකස් කරන ලද හෝ උපයෝගී කරගනු ලබන කොටස් සහ අමතර කොටස්

ඇතුළත් වේ ;

"වත්කම" යන්නෙන් ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි, ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන, චංචල හෝ නිශ්චල, තත්‍ය හෝ විභව්‍ය, කුමන ආකාරයකින් හෝ අත්කර ගන්නා ලද (සමුද්‍රීය යාත්‍රා ද ඇතුළුව) යාත්‍රා වැනි අරමුදල්, භාණ්ඩ සහ සේවා ලබා ගැනීම සඳහා භාවිත කිරීමේ හැකියාවක් පවතින යම් අරමුදල්, දේපළ, මූල්‍ය සම්පත් සහ ඕනෑම ආකාරයක ආර්ථික සම්පත් මෙන්ම ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් හෝ ව්‍යවහාර මුදල්, බැංකු ණය, තැන්පතු, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, ණයකර හා ණයවර ලිපි ඇතුළු එවැනි වත්කම් සඳහා හිමිකම් පෑමේ අයිතිය සහ එවැනි වත්කම් තුළින් ලැබෙන, එමගින් උපචිත වන හෝ උත්පාදනය වන යම් පොළී, ලාභාංශ, ආදායම් හෝ වටිනාකම් අදහස් වේ ;

"කමිටුව" යන්නෙන් 1718(2006) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සඳහා යෝජනා සම්මුතියට අනුගාමීව පිහිටුවන ලද කමිටුව අදහස් වේ ;

"අනුරූපක බැංකු සම්බන්ධතාවය" යන්නෙන්, එක් මූල්‍ය ආයතනයක් (අනුරූපක) විසින් වෙනත් මූල්‍ය ආයතනයක් (ප්‍රතිචාරක) වෙත පහත දැක්වෙන අවස්ථාවන් වල දී, එනම් :-

(අ) අනුරූපක සම්බන්ධතාකරු විසින්, එක් රටක පිහිටි ස්ථිර ව්‍යාපාරික ස්ථානයක සිට හෝ ඒ මගින්, බැංකු ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී ; සහ

(ආ) ප්‍රතිචාර දක්වන්නා විසින් තවත් රටක පිහිටි ස්ථිර ව්‍යාපාරික ස්ථානයක දී හෝ ඒ මගින් බැංකු ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී ; සහ

(ඇ) අනුරූපක සම්බන්ධතාකරු හා ප්‍රතිචාරක අතර පවතින සම්බන්ධතාවය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් එම ස්ථිර ව්‍යාපාර ස්ථාන අතර බැංකු සේවා සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවක දී,

බැංකු ව්‍යාපාරික සේවා සැපයීම හා සම්බන්ධිත සම්බන්ධතාවයන් අදහස් වේ.

"DPRK මූල්‍ය ආයතනය" යන්නෙන් මූල්‍ය ආයතනය යන අර්ථ නිරූපනයේ (අ) සිට (ක) දක්වා ඡේදවල ලැයිස්තුගත කර ඇති යම් ක්‍රියාකාරකමක් සිදුකරන ලබන සහ ;

(අ) DPRKහි යම් නීතියක් යටතේ නියාමනය කරන ලද, ලියාපදිංචි කරන ලද, සංස්ථාගත කරන ලද හෝ බලපත්‍ර ප්‍රදානය කරන ලද ;

(ආ) DPRK විසින් අයිතිය දරන හෝ පාලනය කරනු ලබන ; හෝ

(ඇ) DPRK හෝ එහි කවර හෝ ජාතිකයකු විසින් සම්බන්ධතාවක් පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතනයක් වන හෝ එවැනි මූල්‍ය ආයතනයක පාලිත සමාගමක් වන ;

යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් අදහස් වේ ;

"ආස්ථිත්‍යය" යන්නට

(අ) සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක්, භාරයක්, හවුල් ව්‍යාපාරයක්, අරමුදලක්, සංවිධානයක් ; සහ

(ආ) යම් සමුද්‍රීය යාත්‍රාවක්.

ඇතුළත් වේ.

"මූල්‍ය බුද්ධි ඒකකය" යන්නෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ;

"මූල්‍ය ආයතනය" යන්නෙන් යම් ගනුදෙනුකරුවකු සඳහා හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ පහත දැක්වෙන යම් ක්‍රියාකාරකමක් ඉටුකරනු ලබන යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් අදහස් වේ. එනම් :-

(අ) පෞද්ගලික බැංකුකරණය ද ඇතුළුව මහජනතාවගෙන් තැන්පතු සහ වෙනත් ආපසු ගෙවීම් අරමුදල් භාර ගැනීම ;

(ආ) (ඇප ඇතිව හෝ නොමැතිව) පාරිභෝගික ණය, උකස් ණය, සාධ්‍යකරණය සහ අත්පත් කර ගැනීම ඇතුළු වාණිජ ගනුදෙනු සඳහා මූල්‍ය සේවා සැපයීම ;

(ඇ) පාරිභෝගික නිෂ්පාදන හා සම්බන්ධ වැඩපිළිවෙල වලට අදාළව හැර මූල්‍ය කල්බදු සැපයීම ;

(ඈ) ව්‍යවහාර මුදල් හෝ අගය මාරු කිරීම ;

(ඉ) ණයවර කාඩ්පත් සහ ඩෙබිට් කාඩ්පත්, චෙක්පත්, සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම්, සහ බැංකු අණකර ඇතුළු ගෙවීම් ක්‍රම සහ භෞතික නොවන ස්වරූපයේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හෝ කළමනාකරණය කිරීම ;

(ඊ) මූල්‍ය ඇපකර හෝ බැඳීම් නිකුත් කිරීම ;

(උ) පහත සඳහන් ගනුදෙනු කටයුතු සිදු කිරීම ; එනම්

(i) දරන්නා විසින් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර ;

(ii) විදේශ විනිමය ;

(iii) විනිමය, පොළී අනුපාතික හෝ දර්ශක උපකරණ ;

(iv) පැවරිය හැකි සුරැකුම්පත් ; හෝ

(v) වෙළඳ භාණ්ඩ අනාගත වෙළඳාම් ගිවිසුම් ;

(ඌ) සුරැකුම්පත් නිකුත් කිරීමේ දී සහභාගී වීම හෝ එම නිකුත් කිරීම් වලට සම්බන්ධ මූල්‍ය සේවා සැපයීම ;

(එ) පුද්ගල හෝ සාමූහික ආයෝජන කළමනාකරණය ;

(ඒ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් භෞතික ව්‍යවහාර මුදල්, භාරකාර ගනුදෙනු කල හැකි සාධනපත්‍ර හෝ ද්‍රව සුරැකුම්පත් සුරක්ෂිතව තැබීම හෝ පරිපාලනය කිරීම ;

(ඔ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් වත්කම් ආයෝජනය කිරීම, පරිපාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම ;

(ඕ) නියෝජිතයන් සහ තැරැව්කරුවන් විසින් රක්ෂණ අතරමැදි ක්‍රියා සිදු කිරීම ඇතුළුව රක්ෂණ ප්‍රාරක්ෂණය කිරීම හෝ ස්ථානගත කිරීම ; හෝ

(ක) ව්‍යවහාර මුදල් මාරු කිරීම ;

"අක්‍රීය කරන ලද වත්කම්" යන්නෙන් මේ නියෝග මගින් පනවන ලද තහනම් කිරීමක් හේතුවෙන් ගනුදෙනු කරනු ලැබිය නොහැකි වූ යම් වත්කමක් අදහස් වේ ;

"අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හා ආර්ථික සම්පත්" යන්නෙන් ඇතැම් යාත්‍රා ද ඇතුළු අරමුදල්, භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා භෞතිකව භාවිත කරනු ලැබීමේ හැකියාව ඇත්තා වූ ද, බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර සහ ණයවර ලිපි ඇතුළත්ව, ඕනෑම ආකාරයක ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි චංචල හෝ නිශ්චල,තත්‍ය හෝ විභව්‍ය වූ ද, කවර ආකාරයකින් හෝ අත්කර ගනු ලැබූ වත්කම් සහ විද්‍යුත් හෝ ඩිජිටල් ඇතුළු ඕනෑම ආකාරයකින් වූ ඒ වත්කම් පිළිබඳ අයිතිය සඳහා සාක්ෂි දරනු ලබන නෛතික ලේඛන, පොත්, සාධන පත්‍ර අදහස් විය යුතු අතර ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ.

(i) එම අරමුදල්වලින් වත්කම්වලින් හෝ ආර්ථික සම්පත්වලින් උපචිත වන හෝ ඇතිවන සියලු පොළී, ලාභාංශ හෝ වෙනත් ආදායම් හෝ අගයන් ;

(ii) වක්‍රව අයිතිය දරනු ලබන අරමුදල්, වත්කම් හෝ ආර්ථික සම්පත් ;

"මහාධිකරණය" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණය අදහස් වේ ;

"ආයතනය" යන්නට 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඒ සඳහා ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"සම්බන්ධතාවය" යන්නෙන් යම් මූල්‍ය ආයතනයක (ඍජු හෝ වක්‍ර) පාලනය හෝ අයිතිය පැවතීමක් අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ ;

"තැනැත්තා" යන්නට (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"සමූලඝාතක අවි" යන්නෙන් -

(අ) පහත දැක්වෙන ලේඛනවල ; එනම් :-

(i) S/2006/814 ;

(ii) S/2006/815 ;

(iii) S/2006/853 ;

(iv) S/2006/853/CORR.1 ;

(v) S/2009/205 ;

(vi) S/2013/136 ;

(vii) INFCIRC/254/Rev.9/Part1a ;

(viii) INFCIRC/254/Rev.7/Part 2a ; හෝ

(ix) 2321 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සහ යෝජනා සම්මුතියේ III වන ඇමුණුම ;

යන ලේඛනවල ලැයිස්තුගත කොට ඇති ; හෝ

(ආ) DPRKහි න්‍යෂ්ටික-ආශ්‍රිත, බැලිස්ටික් මිසයිල ආශ්‍රිත හෝ සමූලඝාතක අවි ආශ්‍රිත වැඩසටහන්වලට දායක කරගනු ලැබිය හැකි සහ :-

(i) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව හෝ එහි කමිටු විසින් ගනු ලැබූ ;

(ii) 1718 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සහ යෝජනා සම්මුතියේ 8(අ) (ii) ඡේදය යටතේ ගනු ලැබූ ; සහ

(iii) බලපැවැත්වීම අවසන් නොවූ,

යම් තීරණයකට විෂය වස්තුව වන්නා වූ ; හෝ

(ඇ) ද්විත්ව භාවිත සම්මුතිගත ආයුධ වන්නා වූ සහ 2321 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සඳහා යෝජනා සම්මුතියේ 7 වන ඡේදය යටතේ ගන්නා ලද තීරණයකට විෂයය වන්නා වූ ; හෝ

(ඈ) සමූලඝාතක අවි වැඩසටහන්වලට දායක කරගනු ලැබිය හැකි සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතියේ නියෝගවල තහනම් කර ඇත්තා වූ :

අයිතම, ද්‍රව්‍ය, උපාංග, භාණ්ඩ හෝ තාක්ෂණය අදහස් වේ.

## I වන උපලේඛනය

4 (1) (අ) වන නියෝගය

1. ආයුධ හෝ සම්බන්ධිත ද්‍රව්‍ය ;
2. සමූලඝාතක අවි ;
3. බැලිස්ටික් මිසයිල ආශ්‍රිත භාණ්ඩ ;
4. DPRKහි න්‍යෂ්ටික හෝ බැලැස්ටික් මිසයිල වැඩසටහන්, 2 වන නියෝගයේ සඳහන් කර ඇති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා සඳහා යෝජනා සම්මුති මගින් හෝ පසුව ගෙන එන ලද යෝජනා සම්මුති මගින් තහනම් කරන ලද ක්‍රියාකාරකම්, හෝ DPRKහි යුධ හමුදාවන්හි මෙහෙයුම් හැකියාවන් සඳහා දායක කරගනු ලැබිය හැකි ක්‍රියාකාරකම් හෝ DPRKට පරිභාහිර වෙනත් සාමාජික රාජ්‍යයක යුධ හමුදාවන්හි මෙහෙයුම් හැකියාවන් සඳහා සහාය වන හෝ එම හැකියාව වැඩිදියුණු කරන අපනයන සඳහා දායක කරගනු ලැබිය හැකි යම් අයිතමයක්, ද්‍රව්‍යය, උපකරණයක්, භාණ්ඩයක් හෝ තාක්ෂණයක් ;
5. 2016 දෙසැම්බර් මස 15 වන දිනැති S/2016/1069 (ද්විත්ව - භාවිත සම්මුතිගත ආයුධ අයිතම පාලන ලැයිස්තුව)ලැයිස්තුවෙහි ලැයිස්තුගත කරන ලද අයිතමයන් ද ඇතුළුව ද්විත්ව - භාවිත සම්මුතිගත ආයුධ අයිතමයන් ;
6. 2 වන නියෝගයේ දක්වා ඇති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති මගින් තහනම් කරන ලද ගුවන්යානා ඉන්ධන ;
7. 2 වන නියෝගයේ දක්වා ඇති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති මගින් තහනම් කරන ලද වෙනත් යම් අයිතම.

## II වන උපලේඛනය

(4 (1)(ආ) වන නියෝගය)

1. ආයුධ හෝ සම්බන්ධිත ද්‍රව්‍ය ;
2. සමූලඝාතක අවි ;
3. බැලිස්ටික් මිසයිල - ආශ්‍රිත භාණ්ඩ ;
4. DPRK හි යුධ හමුදාවන්හි මෙහෙයුම් හැකියාවන් සඳහා දායක කරගනු ලැබිය හැකි හෝ DPRK ට පරිභාහිර වෙනත් සාමාජික රාජ්‍යයක යුධ හමුදාවන්හි මෙහෙයුම් හැකියාවන් සඳහා සහාය වන හෝ එය වැඩිදියුණු කරන අපනයන සඳහා දායක කරගනු ලැබිය හැකි යම් අයිතමයක්, ද්‍රව්‍යය, උපකරණ, භාණ්ඩ හෝ තාක්ෂණයක් ;
5. (නිශ්චිත ව්‍යාතිරේකයන්ට යටත්ව) ගල් අඟුරු, යකඩ හෝ යපස් ;
6. රත්තරන්, ටයිටේනියම් ලෝහ පස්, වැනේඩියම් ලෝහපස්, තඹ, රිදී, නිකල් හෝ සින්ක් ;
7. 2 වන නියෝගයේ දක්වා ඇති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති මගින් තහනම් කරන ලද දුර්ලභ භූගත ඛණිජ ;
8. අයිතිය හෝ පාලනය පවරන ලද්දේ ද, නැති ද යන්න නොසලකා අලුත්වැඩියාව, නඩත්තු සේවා, නැවත සකස්කිරීම, පරීක්ෂා කිරීම, ප්‍රතිවර්තන-ඉංජිනේරුකරණය, සහ අලෙවිකරණය සඳහා සම්මුතිගත ආයුධ හෝ සම්බන්ධිත අයිතමයන්හි යම් නැවිගත තොගයක් ;
9. 2016 දෙසැම්බර් මස 15 වන දිනැති S/2016/1069 (ද්විත්ව - භාවිත සම්මුතිගත ආයුධ අයිතම පාලන ලැයිස්තුව) ලැයිස්තුවෙහි ලැයිස්තුගත කරන ලද අයිතමයන් ද ඇතුළුව ද්විත්ව - භාවිත සම්මුතිගත ආයුධ අයිතමයන් ;

10. DPRK වෙත ගමන් කිරීමේ ගුවන් ගමන් හා ආපසු පැමිණීමේ ගුවන් ගමන්වලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා සීමාවන පරිදි සිවිල් මගී ගුවන් යානා සඳහා ගුවන් යානා ඉන්ධන විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් හැර, ඔවුන්ගේ දේශසීමාවේ සිට DPRK දේශ සීමාව දක්වා උත්පාදනය වන හෝ උත්පාදනය නොවන ගුවන් යානා ගැසොලීන්, නැප්තා ස්වරූපයේ ජෙට් ඉන්ධන, භූමිතෙල් ස්වරූපයේ ඉන්ධන හා භූමිතෙල් ස්වරූපයේ රොකට් ඉන්ධන ද ඇතුළු ගුවන් යානා ඉන්ධන ;

11. ඉහත විස්තර කරන ලද අයිතමයන්හි සැපයීම, නිෂ්පාදනය, නඩත්තු කිරීම හෝ භාවිතයට අදාළ තාක්ෂණික පුහුණුව, උපදේශනය, සේවා හෝ සහාය ;

12. ඉහත විස්තර කරන ලද අයිතමයන් නිෂ්පාදනය සඳහා භාවිත කළ යුතු වන ද්‍රව්‍ය, මෘදුකාංග, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණය සහ මෙවලම් ;

13. 2 වන නියෝගයේ දක්වා ඇති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සහා යෝජනා සම්මුතිවල තහනම් කරන ලද වෙනත් යම් අයිතමයන්.

10 - 630

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.